Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය- තර්ක ශාස්ත්‍රය

සතිය- දෙසැ.- 4

ශ්‍රේණිය-13

සකස් කළේ - රත්නපුර කලාප අධ්‍යාපන කාර්යාලය

1. එක්තරා සමාජ විද්‍යා ගවේෂණයක් සඳහා සම්මුඛ සාකච්ඡා ක්‍රමය උපයෝගී කර ගැනීමට ඔබ තීරණය කරයි.

ඒ සඳහා,

(i) පරීක්ෂණයට පාත්‍රවන පුද්ගලයින්ගේ නියැදිය තෝරා ගැනීම.

(ii) පාත්‍රයන්ගෙන් අසනු ලබන ප්‍රශ්න හෝ සාකච්ඡා සකස් කර ගැනීම.

(iii) පරීක්ෂකයින් තෝරා ගැනීම හා ඔවුන් පුහුණු කිරීම.

(iv) දත්ත රැස් කිරීම.

(v) දත්ත විශ්ලේෂණය හා ගොනු කිරීම.

යනාදී වැඩපිළිවෙලේ කටයුතු පිළිබඳ දළ සැලැස්මක් ඉදිරිපත් කරන්න.

(ලකුණු 09 යි)

(ආ) කොළඹ අපරාධ මර්දනය සඳහා ක්‍රියාත්මක වන වැඩපිළිවෙල ජනතා ප්‍රතිචාරය විමසීමක් කිරීමට ඔබට අවශ්‍ය යැයි සිතන්න. ඒ සඳහා කොළඹ ඡන්දදායකයින් විසින් ඔව් හෝ නැත යන උත්තරය දිය යුතු ප්‍රශ්නයක් තැපෑලෙන් යැවීමට ඔබ සකස් කරයි. මිලියනයක් වූ මේ මුළු කොළඹ ඡන්දදායකයින්ගේ අකාරාදී පිළිවෙලට ගැලපූ නම් ලැයිස්තුවක් ඔවුන්ගේ ලිපිනයන් ද සහිත ව ඔබ ලබා ගෙන ඇත. ඔබ මේ පරීක්ෂණය සඳහා සංගහණයෙන් නියැදියක් තෝරා ගනියි.

(i) ඔබ තෝරා ගන්නේ සම්භාවී නියැදියක් ද? ස්තෘත නියැදියක් ද? හේතු දක්වන්න.

(ii) ඔබේ නියැදියට තෝරා ගන්නා පාත්‍රයන්ගේ සංඛ්‍යාව 13 දෙනෙක් පමණ වේ ද? ඒ ඇයි?

(iii) ඔබ පක්ෂග්‍රාහී නොවූ නියැදියක් තෝරා ගන්නේ කෙසේ ද?

(ලකුණු 06 යි)